

## පියෙට්ට්‍රල්සිනා හි ශුද්ධ වූ පියෝ පියතුමන්

# දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමෙන් පසුව කළ යාච්ඤාව

**මා කෙතරම් පහසුවෙන් ඔබ වහන්සේව අමතක කර දමනවාද යන්න, ඔබ වහන්සේ දන්න නිසා, එසේ අමතක නොවීමට,**

**සමිඳුනි මා සමඟ නතර වුව මැනව !**

**දුර්වල මා නිරතුරුවම ඔබ වහන්සේගෙන් ඈත්වී පාපයට වැටෙන නිසා, ඔබ වහන්සේගේ ශක්තිය ලබා ගන්නට,**

**සමිඳුනි මා සමඟ නතර වුව මැනව !**

සමිඳුනි ඔබ වහන්සේ මාගේ ජීවිතයයි. ඔබ වහන්සේගෙන් තොරව මා හට ජීවිත අරුතක් හෝ බලාපොරොත්තුවක් නොමැති බැවින්,

සමිඳුනි මා සමඟ නතර වුව මැනව !

ජීවිතයේ ආලෝකය වන සමිඳුනි ඔබ වහන්සේ මා ළඟ නොසිටී නම් මාගේ ජීවිතය අඳුරට වැටෙන බැවින්,

සමිඳුනි මා සමඟ නතර වුව මැනව !

ඔබ වහන්සේගේ කැමැත්ත පෙන්වා දීම සඳහා,

සමිඳුනි මා සමඟ නතර වුව මැනව !

ඔබ වහන්සේගේ කට හඬ අසා ඔබ අනුගාමී වන්නට මට හැකිවනු පිණිස,

සමිඳුනි මා සමඟ නතර වුව මැනව !

ඔබ වහන්සේ ඇසුරේ සිටිමින් සදාකාලිකවම ඔබ වහන්සේට ආදරය කරන්න මා කැමති නිසා,

සමිඳුනි මා සමඟ නතර වුව මැනව !

ඔබ වහන්සේට අවනතව සිටීම මාගේ එකම පැතුම නිසා,

සමිඳුනි මා සමඟ නතර වුව මැනව !

දුබල මගේ ආත්මය ඔබ වහන්සේට සැනසීම ගෙන දෙන,
ප්‍රේමයේ නිවසක් කිරීමට මා කැමති නිසා,

සමිඳුනි මා සමඟ නතර වුව මැනව !

දින ගෙවී යාමෙන් කාලය නිමාවට ළංව ඇත. අවසානය, මරණය, විනිශ්චය, සදාතනික ජීවනය, ළං වෙමින් පවතින නිසා, මා මඟ නොනැවතී, මාගේ ශක්තිය අලුත් කර ගැනීමට, ඔබ වහන්සේව මට අවැසි වේ දින ගෙවීයාමෙන් මරණයට ළංවන නිසා, අඳුරට, පරීක්ෂාවට, නිස්සාර බවට, වේදනාවට මම බිය නිසා, තනි වු රාත්‍රියේ ඔබ වහන්සේව මට කෙතරම් අවශ්‍ය ද, ඒ නිසා ජේසුනි, මා සමඟ නතර වුව මැනව !

අඳුරු ජීවිතයේ භයංකාරත්වය මැද දිවි ගෙවන මා හට ඔබ වහන්සේව අවැසි නිසා ජේසුනි, මා සමඟ නතර වුව මැනව !

ඔබ වහන්සේගේ ශ්‍රාවකයන් පූප කැඩීමේදී ඔබ වහන්සේව හඳුනාගත් සේම දිව්‍ය ශ්‍රී පූපයෙහි වැඩ වසන ඔබ වහන්සේව හඳුනා ගැනීමට මට උදවු වන්න. එවිට ශුද්ධ වු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේගේ සබැඳියාව, මාගේ අලෝකය වී එම බලයෙන් මා ශක්තිමත් වී අඳුර දුරු කරමින්, ප්‍රීතිමත් හදවතකින් සපිරෙන්නට, මා සමඟ නතර වුව මැනව !

මාගේ ජීවිත අවසන් මොහොතේදී, ශුද්ධ වූ දින - සත්ප්‍රසාද

වහන්සේ තුළින් ඔබ වහන්සේ හා එක් වන්නට නොහැකි
වුවහොත්, ඔබගේ වරප්‍රසාද හා ආදරය ලබාගැනීමට,
ස්වාමීනී මා සමඟ නතර වුව මැනව !

ඔබ වහන්සේගේ දිව්‍යමය සැනසීම ලැබීමට මා සුදුස්සෙක්

නොවුවත්, ඔබ වහන්සේගේ වැඩ සිටීමේ ත්‍යාගය පමණක් මා
පතන බැවින්,

ජේසුනි මා සමඟ නතර වුව මැනව !

ඔබ වහන්සේ සොයමින් ඔබ වහන්සේට මා ආදරය කරන නිසා,

ඔබ වහන්සේගේ ආදරය, ඔබ වහන්සේගේ වරප්‍රසාද, ඔබ
වහන්සේගේ කැමැත්ත, ඔබ වහන්සේගේ හෘදය, ඔබ
වහන්සේගේ ජීවය පමණක් සෑහෙන බැවින් මම වෙන කිසිවක්
නොපතමි. මුළු සිතින්ම ඔබ වහන්සේට සමීප වී ආදරය
කිරීමට මට අවශ්‍ය වන නිසා,

සමිඳුනි මා සමඟ නතර වුව මැනව !

මුළු හදවතින්ම ඔබ වහන්සේට ආදරය කිරීමට මට වරම්

දෙන්න. එවිට ජේසුනි, සදාකාලයටම ඔබ වහන්සේට හද
පත්ලෙන් ආදරය කිරීමට මට හැකි වන්නේය.

ආමේන්